# පුවත් සන්දේශය

## පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
## විද්‍යාපුර, පොළොන්නරුව.

2020 ජූනි මස විශේෂ කලාපය

දු.අං :027-2225305 වෙබ් :- pulathisipurancoe.edu.lk පැක්ස් : 027-2225306

1986 අංක 30 දරණ අධ්‍යාපන විද්‍යාතන පහත ප්‍රකාරව පූර්ව සේවා ගුරු පුහුණුව උදෙසා 2000 වසරේ පෙබරවාරි 12 වන දින සිට ක්‍රියාත්මක ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකි.




### ඇතුලත පිටු

පීඨාධිපතිතුමාගේ පණිවිඩය 2
පුලතිසි පවුලේ නව නියමුවෝ 3
වැඩමුළු හා පුහුණු සැසි 4
සංස්කාරක සටහන 5

# පීඨාධිපතිතුමාගේ පණිවුඩය




2020 ජුනි මාසයේ සිට පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එළි දක්වන සිය තොරතුරු දැනුම් දීම උදෙසා පුවත් ඇතුළත් කර *"පුවත් සන්දේශය"* සඳහා මාගේ සුභ පැතුම් පිරිනමමි.

ශ්‍රී ලාංකීය ගුරු අධ්‍යාපනය සංවර්ධනය උදෙසා පාර්ලිමේන්තුවේ 1986 අංක 30 දරණ අධ්‍යාපන විද්‍යාපීඨ පනතට අනුව දෙදාහ වසරේ දී පිහිටුවන ලද පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය පූර්ව සේවා ආයතනයක් ලෙස සුවිශේෂී කාර්ය භාරයක නිරත වී සිටියි. ප්‍රාථමික මෙන් ම කෘෂි හා ආහාර තාක්ෂණය යන ක්ෂේත්‍රයන්ගෙන් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවන් හදාරණ මෙම විද්‍යාපීඨයේ ශික්ෂණලාභීන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සුවිශේෂී නිපුනතාවක් සහිත **පූර්ණ** පෞරුෂයකින් හෙබි යහපත් ගුරු ආකල්ප වලින් සුසැදි ආදර්ශමත් ක්‍රියාශීලී ගුරුවරුන් ලෙස පාසල් පද්ධතියට යොමු කිරීම අපගේ ඒකායන අරමුණයි. අප සැම ජීවත්වන්නේ තොරතුරු යුගයේ වන හෙයින් අරමුණු පෙර දැරිව ක්‍රියාත්මක වීමේ දී අප ආයතනයට අදාළ වන සකල විධ තොරතුරු බෙදාහදා ගැනීම උදෙසා මෙම පුවත් සන්දේශය අත්වැලක් වේ යැයි අපේක්ෂා කරමි. පුවත් සංදේශය නිර්මාණකරණයට දායක වූ සියලු දෙනාට විද්‍යාපීඨයේ කෘතවේදීත්වය හිමිවේ.

කේ.එස්.කේ.පීරිස්

# ~~~~~~~ පුලතිසියට වෙබ් අඩවියක් ~~~~~~~~~




පීඨාධිපති කේ.එස්.කේ.පීරිස් මහතාගේ උපදෙස් මත www. pulathisipurancoe.edu.lk නමින් අංග සම්පූර්ණ වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී. ආරම්භයේ සිට මේ දක්වා පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අදාළ නා නා විධ තොරතුරු මෙයට ඇතුලත් කර ඇත. විද්‍යාපීඨය හා බැදුණු සියල්ලන්ට ම මින් මහගු ප්‍රයෝජනයක් ලැබීමේ අවස්ථාව දැන් උදාවී ඇත.

# පුලතිසි පවුලට එක් වූ නව නියමුවෝ

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පළමු පන්තියේ නිලධාරීන් අතරින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට අනුව කේ.එස්.කේ. පීරිස් මහතා නව පීඨාධිපති ලෙසත් එච්.එම්. ශාන්තරත්න බණ්ඩාර මහතා අධ්‍යයන හා ගුණාත්මක තහවුරුව උප පීඨාධිපති ලෙසත් එස්.ඩී.සී. වීරසිංහ මෙනවිය පාලන හා මුදල් උප පීඨාධිපති ලෙස ත් 2020 ජුනි මස 08 වන දින සුභ මොහොතින් රාජකාරි ඇරඹූහ.**

පීඨාධිපති
වැඩ භාරගැනීම
උප පීඨාධිපති පාලන
හා මුදල්

වැඩ භාර ගැනීම
උප පීඨාධිපති පාලන
අධ්‍යයන හා
ගුණාත්මක

තහවුරුව
වැඩ භාර ගැනීම



**කේ.එස්.කේ.පීරිස් මහතා**



**එස්.ඩී.සී. වීරසිංහ මෙනවිය**



**එච්.එම්.ශාන්තරත්න බණ්ඩාර මහතා**

# විද්‍යාපීඨ පනතින්

***ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ බිහිවූයේ 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනතින් පවරා ඇති බලතල යටතේය.***

## උප පීඨාධිපතිවරු

| | | |
|---|---|---|
|  |  |  |
| උප පීඨාධිපති<br>පාලන හා මුදල් | උප පීඨාධිපති<br>අධ්‍යයන හා<br>ගුණාත්මක තහවුරුව | උප පීඨාධිපති<br>**අඛණ්ඩ ගුරු**<br>**අධ්‍යාපන** |

## සම්බන්ධීකරණ කථිකාචාර්යවරු

| | |
|---|---|
| <br>සම්බන්ධීකරණ<br>කථිකාචාර්ය<br>(පාලන හා මුදල්) | <br>සම්බන්ධීකරණ<br>කථිකාචාර්ය<br>(අධ්‍යයන හා ගුණාත්මක<br>තහවුරුව) |

# වැඩමුළු හා පුහුණු සැසි

වෘත්තීය සංවර්ධනය උදෙසා තාක්ෂණික මෙවලම් භාවිතය තේමාව යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලය උදෙසා දෙදින වැඩමුළුවක් 2020.06.16 සහ 2020.06.17 යන දිනවල දී විද්‍යාපීඨ ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

- මෙහිදී "Zoom" මෘදුකාංගය භාවිත කොට මාර්ගස්ථ (online) ක්‍රමය මගින් ගුරු සිසුන් සමග අධ්‍යාපන කටයුතු කරන ආකාරය පිළිබඳ ව දින දෙකක් තුළ පුහුණු සැසි හතරකින් සමස්ත කථිකාචාර්ය මණ්ඩලයට ම ප්‍රයෝගික පුහුණුවක් ලබා දීමට හැකි වන පරිදි සැළසුම් කරන ලදී.
- මෙහි විශේෂත්වය වූයේ සමස්ත වැඩමුළුවේ සියලු ම කාර්යයන් කථිකාචාර්ය මණ්ඩලය මගින් ම සිදු කිරීමයි. අප ආයතනයේ ම කථිකාචාර්යවරුන් වන එන්. එම්. එන්. පේමදාස මයා, ඩබ්.ඒ.එම්.පී.ජී.කේ. වනසිංහ මයා, එස්.එම්.ප්‍රියන්ත බණ්ඩාර මයා සමස්ත වැඩමුළුවට සම්පත් දායකත්වය සපයන්නට වූහ.

| 2020 ජුනි 16 පෙ.ව.9.00 සිට පෙ.ව. 12.00 දක්වා සැසියට සහභාගී වූවෝ |
|---|
| **උපපීඨාධිපති එච්.එම්.ශාන්ත රත්න බණ්ඩා මයා, උප පීඨාධිපති එස්.ජී.** ජයවර්ධන මයා, **කථිකාචාර්ය එන්.එම්.එන්.පේමදාස මයා, කථිකාචාර්ය ඩී.එම්.ඩී.කේ.කේ. තල්ගොඩපිටිය මිය, කථිකාචාර්ය** ඩබ්.ඒ.එම්.පී.ජී.කේ.වනසිංහ මයා, **කථිකාචාර්ය** ආර්.ආර්.අබේසිංහ මයා, **කථිකාචාර්ය** ඩබ්.ඩී.ලක්ෂ්මන් කුමාර මයා. |
| 2020 ජුනි 16 ප.ව.1.00 සිට ප.ව. 4.00 දක්වා සැසියට සහභාගී වූවෝ |
| **උප පීඨාධිපති එස්.ඩී.සී. වීරසිංහ මෙය, කථිකාචාර්ය ජේ.එම්.එස්. ආනන්ද මයා , කථිකාචාර්ය** ඒ.එම්.ඩී.කේ. බණ්ඩාර මිය, **කථිකාචාර්ය** පී.එම්.මල්ලිකා ජයමැණිකේ මිය, **කථිකාචාර්ය** එස්.එම්.ප්‍රියන්ත බණ්ඩාර මයා , **කථිකාචාර්ය** ආර්.ඒ.පාලිත මයා |
| 2020 ජුනි 17පෙ.ව.9.00 සිට පෙ.ව. 12.00 දක්වාසැසියට සහභාගී වූවෝ |
| **කථිකාචාර්ය** එල්.ජී.කේ. ලියනගේ මිය, **කථිකාචාර්ය** එච්.එම්.ටී.කේ.ඩී.බණ්ඩාර මයා, **කථිකාචාර්ය** ඩබ්.ඩී.මධුරංගි මිය, **කථිකාචාර්ය** ඒ.කේ.දෙල්ගහවත්ත මයා , **කථිකාචාර්ය** ආර්.එම්.එන්.කේ.රත්නායක මිය. |
| 2020 ජුනි 17 ප.ව.1.00 සිට ප.ව. 4.00 දක්වාසැසියට සහභාගී වූවෝ |
| **කථිකාචාර්ය** ඒ.ජී.ජී.විජේරත්න මයා, **කථිකාචාර්ය** එච්.එම්.ජී.කේ. හීන්කෙන්ද මිය , **කථිකාචාර්ය** කේ.ඒ.අයි.සිරිවර්ධන මිය , **කථිකාචාර්ය** එන්.කේ.ගොඩගේ මිය, **කථිකාචාර්ය** එම්.එල්. මිහිඳුකුල මිය. |

## සීමාවාසික පුහුණුව

කොවිඩ් - 19 වසංගතයට පාසල් වැසීමට පෙර සීමාවාසික පුහුණුව ලබමින් සිටි ශික්ෂණලාභීන්ගේ පුහුණු කාල සීමාව අධ්‍යාපන අමාත්‍යංශයේ උපදෙස් වලට අනුව 2020 ජුලි මස 31 ට පෙර අවසන් කිරීමට අපේක්ෂිත ය.

2020 හා 2021 වර්ෂවල සීමාවාසික පුහුණුවට නියමිත ප්‍රාථමික සහ කෘෂි හා ආහාර තාක්ෂණ පාඨමාලාවල ශික්ෂණළාභීන් 320කගේ වසරක පුහුණුව පාසල් 85 ක් තුළ විද්‍යාපීඨ ආරම්භ කර නොබෝ දිනකින් ම ආරම්භ කිරීමට නියමිත ය.

## අලිවැට නවීකරණය වෙයි.

ආරම්භයේ සිට පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය මුහුණ දෙන ප්‍රබලත ම අභියෝගය වන අලි තර්ජනය යි. එම තර්ජනයෙන් මිදීම උදෙසා අධිබලැති විදුලි රැහැන් වලින් යුත් විදුලි වැටක් ඉදිකරගනු ලැබුව ද, පසු ගිය සමයේ අලින් විසින් ම එය විනාශ කිරීම නිසා නැවතත් විද්‍යාපීඨය අනාරක්ෂිත බවට පත්විය. නව පීඨාධිපතිතුමාගේ පැමිණීමත් සමග අධ්‍යාපන අමාත්‍යංශයේ උපදෙස් මත පොළොන්නරුව වන ජීවී කාර්යාලයයේ සහයෝගයෙන් ද විද්‍යාපීඨ කාර්ය මණ්ඩලවල එකමුතුවෙන් ද විනාශ වූ අලිවැට නවීකරණය කිරීම ආරම්භ කර ඇත.

## සංස්කාරක සටහන

වත්මන් මිනිසා ජීවත් වනුයේ තොරතුරු යුගයක ය. පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට තොරතුරු දැනගැනීම වැදගත් වූවකි. අනෙක් අතට තොරතුරු දැන ගැනීම මූලික මිනිස් අයිතියකි. ලක්දිව ඇතුළු ලොව බොහෝ රටවල් විවිධ අනපනත් සම්මත කර ගනිමින් තොරතුරු දැනගැනීමේ පුද්ගල අයිතිය සඵල කර දීමට උත්සාහ ගෙන ඇත. පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හා සබැදි ආයතන හා පුද්ගල සමූහයේ තොරතුරු දැනගැනීමේ අයිතිය සාධනීය කරලීම මෙම පුවත් සංදේශය තුළින් අපි අපේක්ෂා කරන්නෙමු. ආරම්භයක් ලෙස 2020 වර්ෂයේ ජුනි මාසය තුළ අප සතු තොරතුරු විශේෂ කලාපයක් ලෙසින් සම්පිණ්ඩනය කර එළි දක්වමු. එහෙත් කොවිඩ් වසංගතය නිම වී විද්‍යාපීඨය යථා පරිදි මෙහෙය වන කාලය උදා වූ පසු සිව් මාසික වාර කළාපයක් ලෙසින් වඩාත් සාර්ථක හා ආකර්ශණීය බවින් යුතු ව පුවත් සංදේශයක් අපි ඔබ අතට පත් කරන්නෙමු.

සංස්කාරක.